# අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

## පුරප්පාඩු දැන්වීමයි

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදයම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරන නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. තනතුර - සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) II ශ්‍රේණිය

**පුරප්පාඩු - ප්‍රධාන කාර්යාලය - 01 යි.**

**සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය හෝ සමාජ විද්‍යාව හෝ කළමනාකරණය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.
- 2026.05.01 දිනට වයස අවුරුදු 32 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**සුදුසුකම් (අභ්‍යන්තර අයදුම්කරුවන්) (පහත 1 හෝ 2 සුදුසුකම් සපුරා තිබිය යුතුය.)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2 JM 1-1සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ I ශ්‍රේණියේ තනතුරක වසර දෙකක (02) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**රැකියාවේ වගකීම**

ප්‍රතිපත්ති සාධනය, විධානය/අණ දීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්ය භාරයේ අන්තර්ගත කාර්යයන් අතර, කොටසක් වශයෙන් ගැනිය හැකි වූද, කාර්යයන් අතුරින් ආයතනයේ ඉහළ විධායක නිලධාරියාගේ කාර්ය භාරයට උපස්ථම්භක/පහසුකාරක වන පරිදි තනතුරට විශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන්

**වැටුප් කේතය**

MM-1-3- රු.96,650 -10X2480-15X3450-173,200)+ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

### 02. තනතුර- අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණිය (පුරප්පාඩු -01 යි)

**ප්‍රධාන කාර්යාලය - 01**

සුදුසුකම් (බාහිර අයදුම්කරුවන්) (පහත 1 හෝ 2 සුදුසුකම් සපුරා තිබිය යුතුය.)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය හෝ ගිණුම් ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.
- පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම.
- 2026.05.01 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**සුදුසුකම් (අභ්‍යන්තර අයදුම්කරුවන්) (පහත 1 හෝ 2 සුදුසුකම් සපුරා තිබිය යුතුය.)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත්**

**වැටුප් කේතය :** JM-1-1-රු. (72,650-10X1,360-18X2,040-122,970)+ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි)+EPF/ETF

**රැකියාවේ වගකීම**

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ කළමනාකාර ශ්‍රේණීන්හි නියුතු වූවන්ගේ කාර්ය භාරයට පරිපූරක/සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි විශේෂිතකොට කළමණාකාර/ජ්‍යෙෂ්ඨ කළමණාකාර ශ්‍රේණීන්හි නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව පවරා දෙනු ලබන විගණන, පරිපාලනමය සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් වේ.

### 03. තනතුර - කළමනාකරණ සහකාර (තාක්ෂණික) III ශ්‍රේණිය (පුරප්පාඩු -01යි)

**ප්‍රධාන කාර්යාලය - 01**

**සුදුසුකම්**

- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද පරිගණක ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
- අභ්‍යන්තර අයදුම්කරුවන් ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම අදාළ වේ.
- 2026.05.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටියේ කළමණාකරන සහකාර (තාක්ෂණික) තනතුරට අදාළ සියලු රාජකාරීන්

**වෙනත්**

වැටුප් කේතය MA-2-2-රු (50,540-10X540-7X630-4X1,080-20X1,280-90,270)+ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

### 04. තනතුර - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) III ශ්‍රේණිය (පුරප්පාඩු 03 යි)

**(බස්නාහිර පළාත -02/නැගෙනහිර පළාත -01 )**

**අවශ්‍ය සුදුසුකම්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල හෝ දෙමළ, ගණිතය යන විෂයන් ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් සමත්වීම.
2. 2026.05.01 දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
3. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු අතර, නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය
4. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
5. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය
6. පරිගණක සාක්ෂරතාවය හා යතුරු ලියනය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. (සිංහල / දෙමළ / ඉංග්‍රිසි)

**රැකියාවේ වගකීම වේ**

ආයතනයේ විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**වැටුප් කේතය**

MA 1-2: (46,220-10X540-7X630-12X1080-12X1280=84350/-)+ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි. +EPF/ETF

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හීදී පෙනී සිටිය යුතුවේ.)

### 05. තනතුර - රියදුරු III ශ්‍රේණිය - ප්‍රාථමික ශිල්පීය (PL-3) (පුරප්පාඩු 2 යි)

**(බස්නාහිර පළාත -02)**

**අවශ්‍ය සුදුසුකම්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසයෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම අදාළ බලපත්‍රය ත්‍රී රෝද රථ පැදවීම හා බර වාහන පැදවීම ද ඇතුළත් විය යුතුය රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) ක පළපුරුද්ද ලබා තිබීම.
3 2026.05.01 දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි
4 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
5. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
6. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

**රැකියාවේ වගකීම**

ආයතනය වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවන් වන ප්‍රවාහන කාර්යයන් හි දී අවශ්‍ය වන, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරණ තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

**වැටුප් කේතය**

PL-3:(43,280-10X490-10X540-10X590-12X630-67,040)+ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි.+EPF/ETF

### 06. තනතුර - කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණිය (පුරප්පාඩු 26 යි)

(බස්නාහිර පළාත - II/ නැගෙනහිර පළාත -04/ මධ්‍යම පළාත -03/ සබරගමුව පළාත -03 /වයඹ පළාත 02 දකුණු පළාත 02/ ඌව පළාත 01)

**අවශ්‍ය සුදුසුකම්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.
2. 2026.01.01 දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු අතර
3. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
4. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය
5. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

ආයතනයන්හී කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්යය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැළකේ. මෙම කාර්ය පථයට අයත් කාර්යයන් අතුරින් ඕනෑම කාර්ය භාරයක් ආයතන ප්‍රධානියා /පත්වීම් බලධාරයා විසින් මෙම සේවක ගණයට පවරනු ලැබේ.

**වැටුප් කේතය**

PL-1:(40,500-10X450-10X490-7X540-15X590-62,530)+ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි.+EPF/ETF

(ලිඛිත පරීක්ෂණයකින් හා හෝ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.)

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හීදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුර සඳහා අයදුම්පත් යොමු කිරීමේදී රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හී සේවය කරනු ලබන නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතු අතර, 2026 මැයි මස 29 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කිරීම අනිවාර්යය වේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,**
**අංක 129, මහාධිකරණ සංකීර්ණය,**
**අලුත්කඩේ, කොළඹ 12.**